49807

AL/2022(2023)/22/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022 (2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022 (2023)

භූගෝල විද්‍යාව II
புவியியல் II
Geography II

**22 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස් :**
※ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්වත්** තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස - භෞතික භූගෝල විද්‍යාව

**1.** (i) පස නිර්මාණය වීමට බලපාන භෞතික සාධක **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පාංශු පැතිකඩෙහි කටු සටහනක් ඇඳ, එහි ඕනෑම ස්තර **දෙකක** ගතිලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ප්‍රධාන පාංශු වර්ග කිහිපයක් පහත දැක්වේ. ඒවා අතරින් **දෙකක්** විස්තර කරන්න.
(අ) රතු දුඹුරු ලැටසොල්
(ආ) රතු දුඹුරු පස
(ඉ) දියලු පස (ලකුණු 06 යි)

(iv) වර්තමානයේ දී පාංශු සංරක්ෂණය අත්‍යවශ්‍ය වන්නේ ඇයිදැයි හේතු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**2.** (i) ලෝකයේ ඕනෑම කාන්තාර **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) කාන්තාර ප්‍රදේශවල ජලය මගින් නිර්මාණය වන භූරූප **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) කාන්තාර ප්‍රදේශවල සුළං ක්‍රියාව මගින් ඇති වන ඛාදිත භූරූප **දෙකක්** නිර්මාණය වන ආකාරය රූප සටහන් ආධාරයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) කාන්තාර ප්‍රදේශවල සුළං ක්‍රියාව මගින් නිර්මාණය වන නිධි සාධිත භූරූප **දෙකක්** රූප සටහන් ආධාරයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**3.** (i) නියඟය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) ලෝකයේ හඳුනාගත හැකි නියඟ වර්ග **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) නියඟ උපද්‍රවය ආපදාවක් බවට පත්වන ආකාර **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ නියඟයෙහි අහිතකර බලපෑම් අවම කිරීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

**4.** (i) පරිසර පද්ධතියක් යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) පහත දැක්වෙන මාතෘකා යටතේ 'ශ්‍රී ලංකාවේ නිවර්තන වර්ෂා වනාන්තර' කෙටියෙන් විස්තර කරන්න.
(අ) දේශගුණය
(ආ) වෘක්ෂලතාව
(ඉ) භූගෝලීය ව්‍යාප්තිය (ලකුණු 06 යි)

(iii) ශ්‍රී ලංකාවේ පරිසර පද්ධති ආශ්‍රිතව ගැටලු උද්ගතවීමට තුඩු දී ඇති මානව කටයුතු **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ වනාන්තර සංරක්ෂණය සඳහා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක්** පරීක්ෂා කරන්න. (ලකුණු 06 යි)

[දෙවැනි පිටුව බලන්න.

## II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

**5.** 1981-2021 කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ පළාත් අනුව ජන ඝනත්වය, වගුව 1 හි දක්වා ඇත.

**වගුව 1: ශ්‍රී ලංකාවේ පළාත් අනුව ජන ඝනත්වය, 1981-2021**

| පළාත | වර්ෂය | | | |
|---|---|---|---|---|
| | **1981** | **2001** | **2012** | **2021 (ඇස්තමේන්තුගත)** |
| බස්නාහිර | 1064 | 1461 | 1588 | 1688 |
| මධ්‍යම | 354 | 427 | 453 | 495 |
| දකුණ | 340 | 411 | 447 | 486 |
| සබරගමුව | 298 | 363 | 388 | 420 |
| වයඹ | 216 | 275 | 302 | 329 |
| නැගෙනහිර | 98 | 142 | 156 | 178 |
| ඌව | 108 | 139 | 149 | 165 |
| උතුරු මැද | 81 | 106 | 121 | 134 |
| උතුර | 125 | 117 | 120 | 131 |
| **ශ්‍රී ලංකාව** | **226** | **287** | **310** | **338** |

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව - 2022

(i) ජන ඝනත්වය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) 1981 - 2021 කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ ජන ඝනත්වයෙහි දක්නට ලැබෙන කාලික වෙනස්වීම් **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iii) 1981 - 2021 කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ ජන ඝනත්වයෙහි පළාත් ව්‍යාප්ති රටාවේ කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) ජන ඝනත්වය වැඩිවීම නිසා සංවර්ධනය වන රටවල උද්ගතව ඇති ගැටලු **තුනක්** කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

**6.** (i) ජනාවාසයක් යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) ගැමිනාගරික (rurban) ජනාවාසවල දක්නට ලැබෙන ඕනෑම ගති ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) නාගරික සහ ගැමිනාගරික ජනාවාස අතර පවතින වෙනස්කම් **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ ගැමිනාගරික ජනාවාස ආශ්‍රිතව හඳුනාගත හැකි ප්‍රවණතා **තුනක්** පරීක්ෂා කරන්න. (ලකුණු 06 යි)

**7.** (i) ඛනිජ සම්පතක් යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ප්‍රධාන ඛනිජ සම්පත් **තුනක්** නම් කර, ඒවායේ භූගෝලීය ව්‍යාප්තිය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට ඛනිජ සම්පත් දායකවන ආකාරය නිදසුන් **තුනක්** ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

(iv) ඛනිජ සම්පත් උපයෝජනයේදී ශ්‍රී ලංකාව මුහුණපාන පාරිසරික ගැටලු **තුනක්** නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**8.** (i) යුරෝපා සංගමයේ (European Union) ඕනෑම සාමාජික රටවල් **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) යුරෝපා සංගමයේ අරමුණු **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) යුරෝපා සංගමය මුහුණදෙන ගැටලු **තුනක්** කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාව යුරෝපා සංගමය සමඟ සබඳතා පැවැත්වීම මඟින් භුක්ති විඳින ප්‍රතිලාභ **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

***